

# දෙවියන්වහන්සේ වේදනා විඳීමට ඉඩදෙන්නේ ඇයි?

## මිනිස් විපතට බයිබලයේ පිළිතුර

## (Why does God allow Suffering?)

# දෙවියන්වහන්සේ වේදනා විඳීමට ඉඩ දෙන්නේ ඇයි?

මිනිස් විපතට බයිබලයේ පිළිතුර

# පටුන


| | |
|---|---|
| මිනිස් විපතට බයිබලයේ පිළිතුර | 3 |
| ජීවිතයේ යථාර්තයන් | 4 |
| ජනතාව තමන්ගෙන්ම බේරාගත යුතුද? | 5 |
| දුෂ්ඨකමද නැතිනම් රෝග ලක්ෂණයක්ද? | 6 |
| ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකුගේ අත්දැකිම | 7 |
| වේදනාකාරී ගැටළුව | 7 |
| දෙවියන්වහන්සේ මිනිසා අමතයි | 9 |
| මිනිසා සමඟ දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීම | 10 |
| "යෝබ් දෙවියන්වහන්සේ කෙරෙහි භයවන්නේ නිකමටද?" | 10 |
| නිගමනයන් සමහරක් | 11 |
| දිව්‍යමය හික්මවීමක් | 12 |
| දෙවියන්වහන්සේ වේදනා විඳින්නේද? | 13 |
| දෙවියන්වහන්සේ මැදිහත් නොවන්නේ ඇයි? | 14 |
| දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා එවනලද්දේය. | 14 |
| විඳවීම තුළින් පූර්ණත්වය | 15 |
| "දේවස්වභාවයට පංගුකාරයන්" | 16 |
| "සියල්ල අලුත් කරයි" | 17 |

# දෙවියන්වහන්සේ වේදනා විඳීමට ඉඩ දෙන්නේ ඇයි?

## මිනිස් විපතට බයිබලයේ පිළිතුර

සියල්ලෝම තම ජිවිත වලදී වේදනා විඳීමේ ගැටළුව හඳුනාගනිත්. දරුවෙක් අන්ධව, විකලාංගව හෝ මානසික ආබාධිතව හෝ උපත ලබයි. එවිට මතුවන ප්‍රශ්නය නම්: ඇයි? යන්නය. එම දරුවා කිසි හිංසාවක් කර නොමැත.

ඉතා ඉහළ චරිතවත් බවකින් සහ ජිවිතයේ සුන්දරම අවධියේ සිටිනා මිනිසෙකු හෝ ගැහැණියක්, මරණයෙන් පමණක් නිමාව දැකිය හැකි බලාපොරොත්තු රහිත ව්‍යාධියකින් වේදනා විඳිනු ඇත. ඔහුට එසේ වන්නේ ඇයි ? ඇයට එසේ වන්නේ ඇයි ? ඔවුහු සැබවින්ම ජිවත් විය යුත්තෝය.

අති විශාල ජනගහනයන් සහ අල්ප සශ්‍රීක බවින් යුත් රටවල දසදහස් දෙනා ව්‍යාධීන්ගෙන් සහ අර්ධ නිරාහාරයෙන් පසුවෙත්. ජලගැල්ම සහ භූමිකම්පා වලින් තවත් විශාල ගණනක් විනාශ වී හෝ ගේදොර අහිමි වෙත්. <u>ඔවුන්</u> වේදනා විඳිය යුත්තේ ඇයි?

මනුෂ්‍යයාගේ කෲරත්වය සහ නූතන යුද්ධයේ විනාශකාරී භාවය අසරණ දසදහස් ගණනක් මත වේදනාව, හිංසාව සහ මරණය පටවා තිබේ. ත්‍රස්තවාදී ක්‍රියා, කෲරත්වය සහ පැහැරගෙන යෑම් තුළින් ගිණිය නොහැකි ජිවිත ගණනාවක් නැතිවී ඇත. හදිසි අනතුරු එදා සිටම පැවති නමුත්, වර්තමාන ව්‍යසන සහ ස්වාභාවික විපත්ති වල පරිමාව විශ්මිතය. මගී ගුවන්යානයක් කඩා වැටේ. තෙල් පිරිපහදුවක් පුපුරා යයි. උමං දුම්රිය මගක ගින්නකට සිය ගණනක් කොටුවේ. දෙවියන්වහන්සේ මෙම්වාට ඉඩදෙන්නේ ඇයි දැයි ජනතාව ප්‍රශ්න කරති.

මෙම ප්‍රශ්න නිතැතින්ම මනසට නැගෙන අතර ඒවා මතුපිටින් සාධාරණ ලෙස පෙනෙයි. නමුත් ඒවා දෙස සෘජුවම බැලීමේදී ඒවායේ යම් යම් සම්බන්ධ ඇති බැව්ද පෙනෙනවා ඇත. මනුෂ්‍ය ජිවිතයේ

වේදනා විඳීම, දෙවියන්වහන්සේගේ බලය හෝ ප්‍රේමය සමඟ නොගැලපීම ඔවුහු සම්බන්ද කරති. ප්‍රේමයේ දෙවිකෙනෙකු වශයෙන් එක්කෝ උන්වහන්සේට වේදනා නැති කිරීමේ බලය නොමැති බවත්, හෝ උන්වහන්සේට එම බලය තිබුනද එය ක්‍රියාවට නැංවීමේ කැමැත්ත නොමැති බවද සහ උන්වහන්සේ ප්‍රේමයේ දෙවිකෙනෙකු නොවන බවත්ය. පෙනෙන ලෙස අහිංසකවූ අය මත දැන් පවතින වේදනාව වැළැක්වීම සර්වබලධාරී ප්‍රේමයේ දෙවිකෙනෙකුගෙන් අප බලාපොරොත්තු විය යුතුයැයි යෝජනා කෙරේ. මෙම යෝජනා යුක්ති සහගතද?

## ජීවිතයේ යථාර්තයන්

විනිශ්චයක් සැකසීමේ උත්සාහයට ප්‍රථම, ජීවිතයේ යාථාර්තයන් කිහිපයක් සැලකිල්ලට ගත යුතුය.

1. හේතු-පල විශ්වයක මිනිසා ජීවත්වන අතර සමහර හේතුවල ප්‍රතිපල වලින් බේරීමක් නොමැත. ගින්දර පුලුස්සයි. ජලය ගිල්වාදමයි. රෝගකාරක විශබීජ විනාශ කරයි. මෙම යථාර්ත තුළ සදාචාරාත්මක සම්බන්ධතා තිබේ. තමන් කරන ක්‍රියාවල ප්‍රතිපලවලින් බේරීමට නොහැකි විශ්වයක මිනිසුන් ජීවත්වන අතර එම නිසාම ඔවුන්ගේ ක්‍රියාවල වගකීමෙන්ද ඔවුනට බේරීමට නොහැක. "ස්වභාවික නීතිය" නමැති මෙම බාධකය නොමැතිව මිනිසාට තමන් රිසි ඕනෑම දෙයක් දඬුවමට යටත් නොවී කිරීමට පුලුවන්වන අතර, වගකීමක්ද නොමැතිවනු ඇත. දෙවියන්වහන්සේ මෙවන් ආකාරයකට විශ්වය සෑදුවේ, නිදහස් කැමැත්ත තුළින් තම ක්‍රියා තෝරාගන්නා වගකීමෙන් යුත් මිනිසුන් සාදන, සදාචාරාත්මක දෙවිකෙනෙකු වන නිසාය.

2. තමන්ගේම ජීවිතය නොසලකා හැරීමෙන් සහ අපයෝජනයෙන් මිනිස් ප්‍රවාහයම දූෂණය වී ඇති අතර, පසු පැමිණෙන පරම්පරාවල් මත පවතින අශිෂ්ඨ පල ඉතිරි කර ඇත. ස්වභාවික නීතියේ කොටසක් ලෙස නැවතත් මේවා ව්‍යාධීන්ට ගොදුරු වීමේ ප්‍රවනතාවය සහ පරම්පරාගත දුර්වලකම් ලෙස ප්‍රකාශයට පත්විය හැක. පරම්පරාවකින් තවත් පරම්පරාවකට යාමේදී ජීවිතයේ පදාර්ථයටම බලපෑ හැක.

3. මිනිසාගේ ක්‍රියාවල ප්‍රතිවිපාක සෘජුවම භෞතිකවම පමණක් නොවේ. ඉතිහාසය පුරා ඔවුන් නිපදවන ලද සමාජීය සහ දේශපාලනික දුෂ්ඨකම්, පැමිණෙන පරම්පරාවල් මත එකතු වූ මහා බරක් වේ. ගතවූ ඉතිහාසයේ ප්‍රතිවිපාකයන් නම් වූ දැළ තුළ ජනතාව හසුවී සිටිත්. ඔවුන් එක් නපුරක් පිළියකර කරන්නට යෑමේදී, තවත් එකක් එතැනට පැමිණේ.

"මුළු මැවිල්ල මේ දක්වා එක්ව කෙඳිරිගාමින් ගාවිනා විඳින බව දනිමුව" (රෝම 8:22)

## ජනතාව තමන්ගෙන්ම බේරාගත යුතුද?

මෙවැනි යථාර්තයන් සැලකිල්ලට ගනිමින් සැබැවින්ම වේදනාව ඉවත් කරන්නැයි දෙවියන්වහන්සේගෙන් ඉල්ලන විට අපි කුමක් කරන්නේදැයි ඇසිය යුතුවෙමු. (අ) ස්වභාවික නීතිය අත්හිටුවීමටත් (ආ) ආවේණිය ප්‍රතිවිපාක මග හැරීමටත් සහ (ඇ) මිනිසා විසින් මිනිසාට කරන ලද අමානුෂික ක්‍රියාවල ප්‍රතිපලයයන් ඉවත හරවන්නටත් දෙවියන්වහන්සේගෙන් අපි නොඉල්ලමුද? මනුෂ්‍යයාගේ ක්‍රියාවල ප්‍රතිවිපාක වලින් මනුෂ්‍යයා බේරා ගැනීමට දෙවියන් වහන්සේගෙන් බලාපොරොත්තු වියයුතු අයිතියක් අපට ඇත්ද? උන්වහන්සේ එසේ කලේ නම් එය සදාචාරාත්මක විශ්වයක් වේද?

මෙම ප්‍රශ්නය ඇසිය හැක්කේ මනුෂ්‍යයාගේ හස්තය එම අවස්ථාවන් හා සම්බන්ධ වූ විට පමණි. භූමිකම්පා, කුණාටු, සාගත සහ ජල ගැලීම් "දෙවියන්ගේ ක්‍රියා" ලෙස හඳුන්වන්නේ සාමාන්‍යයෙන් ඒවා සඳහා විකල්ප පැහැදිලි කිරීමක් නොමැති හෙයිනි. ඉතින් මනුෂ්‍යයාගේ ක්‍රියා ඔබ්බෙන්වූ ස්වභාවික විනාශයන් දෙස අප බලන්නේ නම්, ඒවා අසරණ සහ චූදිත යන සියල්ල මත එකසේ වැටෙන බැව් සොයා ගත හැක. මෙම විනාශයන්ගේ බිල්ලට හසුවන අසරණයන් ගැන ප්‍රශ්න කිරීම අප ඇරඹූ වහාම, තවත් උභතෝකෝටිකයක් මතුවෙයි. අප පවසන්නේ "වේදනා විඳිය යුතු අය" පමණක්ම සොයා බලා එම ව්‍යසණයන් තම ක්‍රියාව සාධාරණීය කල යුතු බවද?

## දුෂ්ඨකමද නැතිනම් රෝග ලක්‍ෂණයක්ද?

මෙපමණ දුරක් සෝදිසි කරන ලද මෙම විෂයයේ ලුහුඩු සිතුවිලි යටින් එක් මූලික චින්තනයක් තිබේ. එනම් දුක් විඳීම එය තුළම දුෂ්ඨ බවයි. බුද්ධ ධර්මයේ මූලිකව ඇත්තේ දුක්ඛ නමැති මෙම අනිවාර්යය විඳවීම පිළිබඳ විශ්වාසයයි. බයිබලයේ දර්ශනය මුලුමනින්ම වෙනස්ය. විඳවීම එය තුළම දුෂ්ඨ නොවන අතර, එය වඩා ගැඹුරු දුෂ්ඨභාවයක රෝග ලක්ෂණයකි. විඳවීම පාපයේ විපාකයක් ලෙස ශුද්ධලියැවිලි නිරූපණය කරයි. විඳවීම ලබන පුද්ගලයාගේ පාපයට නොව, මිනිසාගේ සහ මිනිස් සමාජ ඉතිහාසයේ පාපයයි. අපෝස්තුලුවර පාවුල් එහි ආරම්භය පෙන්වයි.

> "එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත්, පාපය කරණකොට ගෙන මරණයත් ලෝකයට ඇතුල්වූවාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව් කල බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුනේය. (රෝම 5:12)

ඒ දිනයේ අකීකරුකමට පසුව ස්ත්‍රිය මත ප්‍රකාශ කල තීන්දුව මෙසේ පවසයි.

> "නුඹේ ශෝකය හා ගැබ් ගැනීම බෝහෝ සෙයින් වැඩි කරන්නෙමි. නුඹ වේදනා සහිතව දරුවන් වදන්නිය. නුඹේ ආශාව නුඹේ පුරුෂයා කෙරෙහි වන්නේය. ඔහු නුඹ කෙරෙහි බල පවත්වන්නේය."

දෙවියන්වහන්සේ පුරුෂයාට මෙසේ පවසනසේක.

> "නුඹ භූමියෙන් ගන්නා ලද බැවින් එයට හැරී යන තෙක්ම නුඹේ මුහුණේ ඩහදියෙන් යුක්තව කෑම කන්නෙහිය. මක්නිසාද නුඹ දූවිලිය. දූවිල්ලට හැරී යන්නේය." (උත්පත්ති 3:16,19)

උගැන්වීම සරලය. මිනිසාගේ අකීකරුකමත් සමඟම මැවුම්කරුවන්ගේ සහ මැවීම අතර සබඳතාවයේ වෙන්වීමක් සිදුවිය. දෙවියන්හන්සේ සහ මිනිසා අතර සබඳතාවය අස්ථානවී ඇත. පළමු වැනි පාපය, සියලු මිනිසුනට පොදු දුෂ්ඨභාවයට බලපාන මූලික වෙනස්

කිරීමක් ගෙන එන ලදී. මරණය විශ්වනියය. නිශ්චිත පුද්ගලයා සඳහා දෙවියන්වහන්සේ එය වෙනස් නොකරන සේක. තමන්ගේ මාර්ග වල ගමන් කිරීමටත් ස්වභාවික නීතියේ ක්‍රියාවලටත් මිනිසා අතහැර දමා ඇති බැව් බයිබල ඉගැන්වීමයි. එහෙත් මිනිසා මතුපිට විනිශ්චයට සහ පෘථිවිය පිරිසිදු කිරීමට ස්වභාවික විපත් දිව්‍යමය ප්‍රභවයකින් පැමිණෙන අවස්ථා තිබේ. මෙයට හොඳම උදාහරණය නෝවාගේ දවස්වල ඇති වූ ජලගැල්මයි.

මෙම අවස්ථාවේදීම, දෙවියන්වහන්සේ සඳහා සේවය සොයන්නා හට, විඳවීම අලුත් අරුතක් ගන්නා බවත් බයිබලයේ සත්‍යයකි. ඔවුන් මැවුම්කරුවාණන් සමඟ නව සබැඳියාවකින් පසුවන අතර, ව්‍යසනය දෙස අලුත් ආලෝකයකින් බැලීමට ඉගෙන ගනී. එය කුමක්ද?

## ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකුගේ අත්දැකීම

යෝබ්ගේ උදාහරණය තුළ පිළිතුර බැලීමට පුලුවන. තමාගේ වත්කමේ උල්පතවූ තම සත්ව රැළ සහ රංචු අහිමි වීමේ විනාශය දුටු දෙවියන්ට කැපවූ මිනිසෙකු මෙන්න. එකම පහරින් තම සියලු දරුවන් තමන්ගෙන් වෙන් කල භයානක බවත්, අනෙකුත් මිනිසුන්ගෙන් තමන් වෙන කල වේදනාත්මක ව්‍යාධියකින් පහර කෑ මිනිසෙකු වෙන්න. නමුත් ඔහු මෙසේ පවසයි. "අපි දෙවියන්වහන්සේ අතින් යහපත පිළිගනිමු නම් අයහපතත් පිළිගන්නට ඕනෑ නොවේද?" (යෝබ් 2:10) අයිතිවාසිකමක් ලෙස යහපත ඉල්ලා සිටීමේ නොහැකියාව නමැති වැදගත් ප්‍රතිපත්තිය ඡේ හඳුනාගනී. දෙවියන්වහන්සේ කෙසේ ක්‍රියා කරන්නේදැයි තීරණය කිරීම ඔහු සතුව නොමැත.

## වේදනාකාරී ගැටළුව

කෙසේ නමුත්, විඳවීම උසුලාගත නොහැකි වන තරම් වූ විට, මරණය හොඳ යැයි සිතෙන අවස්ථාව පැමිණෙයි. වේදනාවෙන් සහ වියවුල්ව ඔහු මෙසේ අසයි. වේදනා විඳවීමට පමණක්ම නම් මනුෂයෙකු ජීවත්විය යුත්තේ ඇයි? මනුෂ්‍යයා සෑදූ දෙවියන්වහන්සේ හට, විසිකරන ලද කෙළිබඩුවක් ලෙසින් ඔහු විනාශ කිරීමට හැකිද?

මිනිසාත් පාපයත් ඔහුගේ විඳීමත් අතර ඍජු සබැඳියාවක් ඇති බව ඔහුගේ මිතුරන් තර්ක කරන අතර එම නිසා මෙතරම් විඳවීමක් සඳහා යෝබ් මහා පාපකර්ම කර ඇති බැව්ද පවසත්. තමාගේ අවංක භාවය ගැන යෝබ්ට සහතිකය. තමා මනුෂ්‍යයෙකි, නමුත් ඔවුන් තමා හට බද්ධ කිරීමට උත්සාහ කරන පාප ගැන තමා නිවැරදිකරු බව ඔහු දනී. තමා නිකරුණේ වේදනා විඳින බැව් හැඟවීමට උත්සාහ කරන තම මිතුරන්ගේ දර්ශන ඔහු වෙහෙස කරයි. තමා දෙවියන්වහන්සේ විසින් විඳීම සඳහා යොදාගන්නා ඉලක්කයක් ලෙස තෝරාගන්නේද? මක්නිසාද, අනෙකුත් අය සමඟ සැසඳීමේදී, තමා පාපොච්චාරණය කළ යුතු තරමේ වැරදි සමඟ තම විඳවීම් නොසැසඳෙන බැව් පෙනෙන හෙයිනි. මෙම ව්‍යාධි තුළින් දෙවියන්වහන්සේ තමාට විරුද්ධවූ බැව් ඔහුට පෙනෙන අතර, මෙම සදාචාරාත්මක ගැටළුව ඔහුගේ අප්‍රසන්න භාවය උග්‍ර කරයි. “සොරුන්ගේ කූඩාරම්” සමෘද්ධිමත් වේ. ධර්මිෂ්ඨයන් වේදනා විඳින්නේ මන්ද? දෙවියන්වහන්සේ ඔහු විනිශ්චය කරන්නේ නම්, මිනිස් ස්වභාවය ලඟා නොවෙන්නාවූ ප්‍රමිතියකින් ඔහු විනිශ්චය කිරීම සුදුසුද?

ඔහුගේ ස්වයංධර්මිෂ්ඨභාවය තුළ විශ්වාසය මිතුරන්ට නොසෙල්විය හැකි වූ අතර අන්තිමේදී ඔවුන් තර්ක කිරීම අත්හරී. නමුත් ප්‍රශ්න කිරීම් වලට එරෙහිව යෝබ්ගේ අරගලය අභ්‍යන්තරයේ ඇත්තේ අවසාන වශයෙන් දෙවියන්වහන්සේ තුළ විශ්වාසයත් දෙවියන්ගේ විනිශ්චයේ විශ්වාසයත්ය. එම නිසා දැන් නොවේ නම්, තවත් ජීවිතයකදී, තම මිදුම්කරුවන දෙවියන්වහන්සේ තමා උසස් කරනු ලබන බවත්, තමන් අසල සිටිනු ඇති බවත් යන බලාපොරොත්තු දෙසට යොමු වෙයි. ඉතින්, උත්ථානය සහ නැවත සමාදානය දෙස සොහොනට ඔබ්බෙන්වූ තර්කයේදී ඔහු නව සංඝටකයක් හඳුන්වා දෙයි. යෝබ් පොත විසින් ඉඟ කරන ලද එම විශ්වාසය, පැරණි සහ නව ගිවිසුම් තුළ වෙනත් ස්ථානවල ප්‍රකාශ කර ඇති අතර, එය ගැටළුවට අලුත් දර්ශන තලයක් ගෙන දෙයි. එහෙත් එයට, මෙම ජීවිතය තුළදී මිනිසා සහ ගැහැණිය පීඩා විඳින්නේ මන්ද යන්න විස්තර නොකරයි.

## දෙවියන්වහන්සේ මිනිසා අමතයි.

මිතුරන් නිහඬවූ පසු, යෝබ් තම අවසන් කථාව පැවැත්වූ අතර, තර්ක කිරීමට එලිහු නම් තරුණයා පැමිණෙයි. දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨභාවය ගැන යෝබ් තම අන්තයේදී ප්‍රශ්න කර ඇති බැව් පෙන්වන ඔහු, ගැටළුව දෙසට අලුත් ආලෝකයක් යොමු කරයි. දෙවියන්වහන්සේ (අ) එළිදරව් තුලින් සහ (ආ) වේදනා විඳීම තුළින් මිනිසාට කථා කරන සේක. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේම ක්‍රමය මගින් මිනිසුනට සහ ස්ත්‍රීන් සමඟ සංනිවේදනය කරන අතර ඔවුන් උන්වහන්සේ දෙසට ගෙන්වා ගන්නා සේක. (යෝබ් 33:14-18 කියවන්න.)

ඔවුන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනයත්, ජීවිතයේ මගපෙන්වීමටත්, විනාශයට යන ඔවුන් බේරා ගැනීමට දෙවියන්වහන්සේ මිනිසුන්ට කථා කරන බැව් එලිහු පවසයි. උන්වහන්සේ "මනුෂ්‍යයා ඔහුගේ අදහසින් හරවා උඩඟුකම මනුෂ්‍යයාගෙන් පහකර" තම ස්වංප්‍රකාශිත මාර්ගයෙන් ඔහු වෙනතකට යොමු කරන්නේ, පාපයේ උල්පත උඩගුකම බැවිනි. අනෙකුත් සංනිවේදන ගැන එලිහු මෙසේ පවසයි.

> "ඔහු තමාගේ යහනේදී වේදනාවෙන්ද, තමාගේ ඇටවල නිරන්තර පොරයකින්ද දඬුවම් ලබන්නේය. ඔහුගේ ප්‍රාණය කෑමටද ඔහුගේ ආත්මය රස භෝජනයටද අප්‍රිය කරන්නේය. නොපෙනන ලෙස ඔහුගේ මාංසය ක්ෂයවී, නොපෙනුනාවූ ඔහුගේ ඇට පැදෙන්නේය. එසේය ඔහුගේ ප්‍රාණය මිනී වළටත් ඔහුගේ ජීවිතය විනාශකාරයන්ටත් ලැබෙන්නේය." (යෝබ් 33:19-22)

වේදනා විඳීමේ විස්තරය යෝබ් සඳහා සුවිශේෂීව යෝග්‍යවෙන අතර, එලිහු පවසන්නේ ස්වාමින්වහන්සේගේ තරවටුවත්, දෝශාරෝපණයත්, හික්මවීමත් ඔහුට අවශ්‍යවන්නේ, ඔහුගේ මිතුරන් පැවරූ විශේෂිත පාප නිසා නොව - එලිහු ඒවා සඳහන් නොකරයි. නමුත් වඩා සියුම් වැරැද්දක් සඳහාය. එලිහු එය දෙස ඉඟි කර තිබුනි. මක්නිසාද එය ආත්මික උඩඟු බවේ පාපයයි. විඳවීමේ අත්දැකීම තුළින් පමණක් එය මතුපිටට රැගෙන ඔහු වැරදිකරුවා ලෙසට නම් කල හැක.

## මිනිසා සමඟ දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම

එම නිසා විඳවීම, ඔවුන්ගේම වැඩි දියුණුව උදෙසා සහ ඔවුන් උන්වහන්සේ තුළ දැන ගැනීමට ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ මිනිසා සමඟ කරන ක්‍රියාවලියේ කොටසක් විය හැකිය. යෝබ්ට එහි ප්‍රතිපලය වූයේ දෙවියන්වහන්සේ ගැන අලුත් සහ වඩාත් සමීප දැන ගැනීමකි. ඔහුට මෙසේ පවසන්නට හැකි විය.

"මා ඔබ ගැන කනින් අසා තිබුණේය.
නමුත් දැන් මාගේ ඇසින් ඔබ දකිමි.
එබැවින් මම මටම පිළිකුල් කොට,
දූවිල්ලේත් අළුවලත් හිඳ පශ්චත්තාප වෙමි" (යෝබ් 42:5-6)

මිනිසා සමඟ දෙවියන්වහන්සේගේ මෙම ක්‍රියාව එහි ස්වභාවයෙන්ම පෞද්ගලික විය යුතුය. මෙහි පෞද්ගලික අත්දැකීමක් ලබා ගත හැක්කේ විඳවීම ලබන මිනිසාට පමණි. විඳවීමේ විශාල ගැටළුව එසේම පවතින අතර යෝබ්ගේ පෙතෙන් උකහා ගත හැකි එකම පිළිතුර නම්, දෙවියන්වහන්සේගේ රාජකීයත්වය සහ නැනවත් බව මිනිසාට ප්‍රශ්න කල නොහැකි බවයි. උන්වහන්සේ මුලු ජීවිතවල මැවුම්කරුවාණන් සහ පෝෂණ කරුවාණන් වන අතර උන්වහන්සේගේ ක්‍රියාකාරකම් මිනිසාගේ ඥාණයෙන් ඔබ්බෙහි පවතී. 38-41 දක්වා පරිච්ඡේදවල කුණාටුව තුළින් ඇසෙන කටහඬ මගින් මහත් බලයෙන් සහ අලංකාරත්වයෙන් විස්තර කර දෙන්නේ මෙම පිළිතුරයි. මිනිසාට හැක්කේ දෙවියන්වහන්සේගේ මාර්ග තමාගේ විනිශ්චයන්ට ඔබ්බෙන්වූ බැව් පිළිගැනීම පමණි.

## "යෝබ් දෙවියන්වහන්සේ කෙරෙහි භයවන්නේ නිකමටද?"

එම නිසා, විඳවීම පිළිබඳ යෝබ්ගේ පොත සරල පිළිතුරක් නොදෙන නමුත් එය වඩා පුළුල් තලයක් දෙසට ඔසවා තබා ඇත. ඔහු දෙවියන්වහන්සේට සේවය කලේ තම නිවාස, ඉඩම්, සත්ව රංචු හෝ දරුවන් නිසා නොවන බැව් මෙම අලාභ සහ විඳවීම් තුළින් පමණක් යෝබ්ට දැනගත හැකි විය. ඔහු සේවය කලේ තමන් ගැන, තම සෞඛ්‍යය ගැන හෝ සශ්‍රීක බව නිසා හෝ නොවේ. ඔහු දෙවියන් වහන්සේට වන්දනා කලේ උන්වහන්සේ දෙවියන්වහන්සේ නිසාය.

ඔහුගේ මනසේ සහ ශරීරයේ පීඩනය තුළින් පැමිණි සියලු රළු වදන් වලට එරෙහිව, දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨභාවය සහ විශ්වාසවන්තභාවය තුළ ඔහුට පයඨින්ත විශ්වාසයක් විය. ඔහු සතු සියල්ල ඔහුගෙන් උදුරාගත් විට පමණක්, දෙවියන්වහන්සේ තමන්ගේ එකම ආරක්ෂාව බැව් හේ සැබවින්ම දැන ගත්තේය. මෙම වටහා ගැනීමේදී, මිතුරන් තිදෙනා විසින් මූර්තිමත් කරන ලද එදිරිකාරයාගේ වහසි බස්වලට එරෙහිව ඔහු ජයග්‍රාහිව ඔසවනු ලැබුවේය.

දෙවියන්වහන්සේ තුළ යෝබ්ගේ විශ්වාසය විභාගය මගින් පරීක්ෂා කරනු ලැබ, විභාගය මගින්ම වානේ මෙන් පන්නරය ලදහ. දෙවියන්වහන්සේගේ ඥානවන්තභාවයේ මෙම අවසන් පිළිගැනීමෙන් සහ විඳවීම තුළින් විශ්වාසය ගොඩනැගිය හැකි බැව් හැදෑරීමෙන්, යෝබ් අවසානයේදී දෙවියන්වහන්සේ ගැන පූර්ණ දැනගැන්මකට පැමිණියේය.

## නිගමනයන් සමහරක්

මෙපමණ දුරක් සලකා බලන ලද දෙයින් ගතහැකි නිගමනයන් පහත පෙනෙන සේ සංක්ෂිප්ත කල හැක.

1. මිනිසා ජීවත්වන්නේ සැලසුම් කරන ලද හේතු පල විශ්වයක බවත් එහි විපාක පිළිගත යුතු බවත්ය. මිනිස් ජීවිතය තුළට පාපය ඇතුළු වූ නිසා මොවුන් වේදනා විඳීම හා බැඳී පවතී. විඳවීම, එම විඳවන්නාගේ පාපයට බැඳී නොපැවතිය හැකි අතර, එය පූර්ව පරම්පරාවක ක්‍රියාවන්ගේ ප්‍රතිපලයක් විය හැක.

2. එසේම, එය නැනවත්බවේ සහ ප්‍රේමයේ දෙවිකෙනෙකු සතු විශ්වයක් වන අතර, උන්වහන්සේ තමන්වහන්සේ සොයන්නන් තමන්වහන්සේ ගැන ගැඹුරු දැනුමක් කරා රැගෙන ඒම සඳහා වේදනාව හැසිරවීමටත් පාලනය කිරීමටත් සොයන්නාවූ දෙවිකෙනෙකි.

## දිව්‍යමය හික්මවීමක්

හිතෝපදේශ පොතේ කියමනක් පාදක කරමින් හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියේ කොටසක් වටහා ගැනීමට මෙම පසුව සඳහන් කල නිගමනය ආලෝකයක් කර ගනිමු.

> "ඇරත් පුත්‍රයන්ට මෙන් නුඹලාට කියන අවවාද වචනය නුඹලා මතක නැති කළාහුය. ඒ කවරද යත්: මාගේ පුත්‍රය, ස්වාමීන් වහන්සේගේ දඬුවම සුළු නොකරන්න. උන්වහන්සේගෙන් තරවටුව ලබන කල ක්ලාන්ත නොවන්න, මක්නිසාද ස්වාමීන්වහන්සේ ප්‍රේම කරන අයට උන්වහන්සේ දඬුවම් කරන සේක. උන්වහන්සේ පිළිගන්න සියලු පුත්‍රයන්ට තලනසේක, යනුයි. නුඹලා ඉවසන්නේ දඬුවම් පිණිසය. දෙවියන්වහන්සේ පුත්‍රයන්ට මෙන් නුඹලා කෙරෙහි ක්‍රියාකරන සේක. මක්නිසාද පියා දඬුවම් නොකරන පුත්‍රයා කවුද? එහෙත් සියල්ලන් ලබන දඬුවමට නුඹලා පංගුකාරයෝ නොවන්නාහු නම්, නුඹලා පුත්‍රයෝ නොව අවජාතකයෝය. තවද අපට දඬුවම් කලාවූ මාංසයේ පියවරු අපට සිටියෝය. අපි ඔවුන්ට ගෞරව කලෙමුව. ඊට බොහෝ වැඩියෙන් අප විසින් ආත්මවල පියාණන්වහන්සේට යටත්ව ජීවත්වෙන්ට යුතු නොවේද? මක්නිසාද ඔවුහු ඇත්තෙන්ම තමුන්ට යහපත්ව පෙනුනු ලෙස ස්වල්ප දවසකට දඬුවම් කලෝය. නමුත් උන්වහන්සේ තමන්ගේ ශුද්ධකමට අප පංගුකාරයන් වන පිණිස අපේ ප්‍රයෝජනය සඳහා දඬුවම් කරන සේක. කිසි දඬුවමක් ලබන කල ඒක ශෝකයට මිස ප්‍රීතියට කාරණාවක් මෙන් පෙනෙන්නේ නැත. නමුත් පසුව එයින් පෙළුණු තැනැත්තන්ට ධර්මිෂ්ඨකමේ සමාදාන පල හටගන්නේය. එබැවින් හෙලා තිබෙන අත්ද බෙලහීණ දණහිස්ද සවිකර ගනිල්ලා............" (හෙබ්‍රෙව් 12:5-12, හිතෝපදේශ 3:11-12)

සන්දර්භය කියැවීමේදී මෙම කොටස එය විසින්ම තේරුම් කර දෙයි. විඳවීම සහ නැතිවීම මිනිසාට පොදුය. නමුත් දෙවියන් වහන්සේගේ දරුවනට එය ඔවුන්ගේ ස්වර්ගීය පියාණන් විසින් ආත්මීය පුහුණුවක් ලෙසත්, එපරිද්දෙන්ම උන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කිරීමක් ලෙසත් යොමු කරන ලද්දේය.

## දෙවියන්වහන්සේ වේදනා විඳින්නේද?

විඳවීම තේරුම් ගැනීමේ තවත් තලයකට ලගාවිය හැක. එනම්, මිනිසාගේ විඳවීම දෙවියන්වහන්සේට සමම්බන්ධ වී ඇති බවත්, උන්වහන්සේගේ ප්‍රේමය තුළින් තමන්වහන්සේගේම පුත්‍රයා ඔවුන් සඳහා මිය යාමටත්, විඳවීමටත් ඉඩ හැරීම සඳහා දානය කරන ලද බවත්ය. යේසුස්වහන්සේ සම්පූර්ණයෙන් අහිංසකවූ අතර කිසිම විධියේ පාපයකින් කිලිටි වී නොතිබුනු නමුත් උන්වහන්සේ ස්වෙච්ඡාවෙන්ම තම මිත්‍රයන් උදෙසා අසාධාරණය විඳීමටත් කෲරත්වයටත්, නව ජීවිතය ඉවත දැමීමටත් ඉදිරිපත් විය.

> "මෝසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසට මනුෂ්‍ය පුත්‍රයාද උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැම දෙනාම, සදාකාල ජීවනය ලබන පිණිස ඔසවනු ලබන්නට ඕනෑය. මක්නිසාද, දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතික පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකල සේක. එසේ කලේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද, දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එවූයේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය." (යොහන් 3:14-17)

"යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක් කිසිවෙකුට නැත." මිනිසාගේ මිදීම උදෙසා තමන්වහන්සේගේ ආදරණීය පුත්‍රයා කුරුසියේ වේදනා විඳීමට එවීමට වඩා මහත් ප්‍රේමයක් දෙවියන්වහන්සේටද නැත.

එම නිසා, දෙවියන්වහන්සේද වේදනා විඳින බැව් කීම නිවැරදිවන අතර, ඊශ්‍රායලය අරභයා දෙවියන්වහන්සේගේ සම්බන්ධය ගැන දිවැස්වරයා පවසන දේ වටහා ගැනීමටද හැක.

> "ඔවුන්ගේ සියලුම දුක් වලදී උන්වහන්සේ දුක් වූ සේක. උන්වහන්සේගේ අභිමුඛය වන දූත තෙමේ ඔවුන් ගැළවූයේය. (යෙසායා 63:9, විනිශ්චයකාරයාගේ පොත 2:16 ද බලන්න.)

## දෙවියන්වහන්සේ මැදිහත් නොවන්නේ ඇයි?

ඊශ්‍රායලයේ දෙවියන්වහන්සේ දුරස්ථ, නිෂ්ක්‍රිය ප්‍රථම හේතුව නොවේ. උන්වහන්සේගේ ශුද්ධාත්මයට ශෝක වීමට හැකිය. උන්වහන්සේට බලාපොරොත්තුවේ දයාවෙන් උද්වේගයට පත්විය හැක. උන්වහන්සේට සදාකාලික ප්‍රේමයකින් ප්‍රේමකල හැක. මේ සියල්ල ශුද්ධ ලියවිලි ප්‍රකාශන වන අතර, උන්වහන්සේ මවන ලද පුරුෂයන් සහ ස්ත්‍රීන්ගේ ජීවිත තුළට තමන්ගේ ශුද්ධවූ මහෝත්තමභාවය මගින් ඇතුලත් විය හැකි විශිෂ්ඨතම පුද්ගලභාවයේ දෙවියන්වහන්සේ ලෙස එළිදරව් කරයි.

ජනතාව නිරතුරුවම මෙසේ අසත්. වේදනා විඳීම නැවැත්වීම සඳහා දෙවියන්වහන්සේ මැදිහත් නොවන්නේ ඇයි, යුද්ධය නතර නොකරන්නේ ඇයි, වසංගත නොනවත්වන්නේ ඇය? යනුවෙන්. සැබැවින්ම දෙවියන්වහන්සේ මිනිසාගේ කාර්‍යයන් කෙරෙහි මැදිහත්වන සේක. ඉතිහාසයේ බොහෝ අවස්ථාවලදී උන්වහන්සේ තමන්වහන්සේගේ බලය පෙන්වා ඇත. නමුත් මෙම මැදිහත් වීමට සීමාවක් තිබේ. උන්වහන්සේ මිනිසාට නිදහස් කැමැත්ත දී ඇත. හොඳට හෝ නරකට එම නිදහස් කැමැත්ත පාවිච්චි කිරීමටද ඉඩදී තිබේ.

උන්වහන්සේගේ ජනතාවවූ ඊශ්‍රායලයේ ඉතිහාසය තුළ දෙවියන්වහන්සේ මැදිහත් වූ අතර, උන්වහන්සේට වන්දනා කිරීමටත්, උන්වහන්සේ ගැන සාක්ෂි දැරීමටත් විශේෂ අවස්ථා ඔවුනට දෙන ලදී. උන්වහන්සේගේ එළිදරව් ඔවුනට විශ්වාසීව භාර දුන් අතර පැමිණෙන්නොවූ මෙසායා ගැන අනාගත වාක්‍ය සහ පොරොන්දුව දෙන ලදී.

## දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා එවනලද්දේය

වසර 2000 කට ප්‍රථම, පාපයෙන් සහ මරණයෙන් මිදීම ගෙන ඒම සඳහා, මිනිස් වේදනාවේ උච්චතමය උරුමකර ගැනීමට තම පුත්‍රයාණන් ක්‍රිස්තුස්යේසුස් පරිත්‍යාග කිරීමෙන්, දෙවියන්වහන්සේ මිනිසා සහ මිනිසාගේ ඉතිහාසය තුළ මැදිහත්කම් කල සේක. මිනිසා

සතු ජීවිතයෙන් සහ ස්වභාවයෙන් ක්‍රිස්තුස්වහන්සේ පැමිණි සේක. මිනිස් වර්ගයාගේ පොදු උරුමය වූ අපගේ අත්දැකීම වන අභ්‍යන්තරයෙන් පැමිණෙන පෙළඹීමත් බාහිරින් පැමිණෙන උපද්‍රවයත් උන්වහන්සේ උරුම කරනසේක.

> "ඒ තැනැන්වහන්සේ.......... ඔවුන්ගේ ගැලවීමේ කර්තෘන් වහන්සේ දුක්විඳීම කරණකොට ගෙන සම්පූර්ණ කරන්නට යුතුවූයේය....... සෙනඟගේ පවු උදෙසා ශාන්ති පූජාවක් ඔප්පු කිරීමට දෙවියන්වහන්සේ පිළිබඳ කරුණු ගැන දයාවන්තවූ විශ්වාසවූ උත්තම පූජකයෙක් වෙන පිණිස, සියලු දෙයින් තමන්ගේ සහෝදරයන්ට සමානවෙන්ට උන්වහන්සේට යුතුවූසේය. මක්නිසාද උන්වහන්සේම පරීක්ෂා කරනු ලැබ දුක් වින්ද බැවින්, පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිටවෙන්ට උන්වහන්සේට පුලුවන." (හෙබ්‍රෙව් 2:10-18)

"උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නුමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙනගත් සේක. (හෙබ්‍රෙව් 5:8) දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව කීකරු වී, විඳවීම පිළිගනිමින් උන්වහන්සේ එය අලුත් තලයකට ඔසවා තබන අතර එය තවදුරටත් මහා දුශ්ඨභාවය නොව අවසානයක් කරා යාහැකි මාර්ගයක් ලෙස පෙන්විය. විඳවීම තුළින් දෙවියන්වහන්සේ හට උන්වහන්සේගේ සම්පූර්ණ කීකරුකමින්, උන්වහන්සේ මනුෂ්‍යය ස්වභාවය තුළ පාපයේ බලය ජයගෙන, පියාණන්වහන්සේ සමඟ සදාකාල ජීවිතයට මරණින් නැගී සිටීමට හැකි බැව් පෙන්විය. මෙමගින් උන්වහන්සේගේ සියලු අනුගාමිකයන් සඳහා නිදර්ශණයක් ලෙසින්, පරිපූර්ණත්වයත්, නොසෙල් වෙන විශ්වාසයත්, කීකරුකමේ පූර්ණභාවයත්, දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ පිරිපුන්භාවය සහ මිනිසාට සේවයත් ලබා ගත්සේක.

## විඳවීම තුළින් පූර්ණත්වයට

> "එසේය, ඊට නුඹලා කැඳවනු ලැබූවහුය. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධ වින්ද, නුඹලා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක. උන්වහන්සේ කිසි පාපයක් නොකල සේක. උන්වහන්සේගේ

මුඛයෙහි වංචාවක්ද සම්භවුනේ නැත. උන්වහන්සේ නින්දා කරනු ලැබූ කල නිනිදා නොකල සේක. වධවින්ද කල තර්ජන නොකර, ධර්මිෂ්ඨ ලෙස විනිශ්චය කරන තැනන්වහන්සේට කාරණය බාරදුන් සේක. අප පාප වලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත්වන පිණිස, උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන්, ඉසුලූ සේක. උන්වහන්සේගේ තුවාල වලින් නුඹලා සුව කරනු ලැබුවහුය." (1 ප්‍රේතෑස් 2:21-24)

"මෙසේ උන්වහන්සේ සම්පූර්ණ කරනු ලැබ..... තමන්වහන්සේට කීකරුවෙන්නාවූ සියල්ලන්ටම සදාකාල ගැළවීමේ කර්තෘ වූ සේක." (හෙබ්‍රෙව් 5:9) මනුෂ්‍යයාට තමන් විසින්ම ලබාගත නොහැකි ගැලවීමක ප්‍රභවයක, උල්පතක කර්තෘ උන්වහන්සේය. උන්වහන්සේගේ පූජාවීම නිසා, ජීවිතය යඳහා උන්වහන්සේ වෙතට පැමිණෙන ස්ත්‍රී පුරුෂයෝ, දෙවියන්වහන්සේගේ දයාව තුළින් ක්‍රිස්තුස්වහන්සේගේ අවයව ලෙස පිළිගැනේ. ඉඳින්, ක්‍රිස්තුස්වහන්සේ තෙවැනි දින නැගී සිටියාක් මෙන්, උන්වහන්සේ තුළට බෞතිස්මය ලබන අය සඳහා වර්තමානයේ අලුත් ජීවිතයකට ආත්මික උත්තානයක්ද, උන්වහන්සේ නැවත පැමිණි විට භෞතික උත්තානයක් සහ අමරණීයත්වයට වෙනස් කිරීමේ බලාපොරොත්තුවද තිබේ.

## "දේවස්වභාවයට පංගුකාරයන් "

ස්ත්‍රී පුරුෂයෝ "දේවස්වභාවයට පංගුකාරයන්" (2 පේත්‍රැස් 1:4) වන්නේ නම්, පාපය තුළින් සැබැවින් දෙවියන්වහන්සේ හැඳින ගැනීමේ තලයකට ඔසවනු ලබා, උන්වහන්සේ සමඟ සදාකාල සාමාජිකත්වයක් වින්දනය කරන්නට සහ උන්වහන්සේගේ දූෂිත නොවන්නාවූ ජීවිතයේ පංගුකාරයකු වන්නට නම්, මෙය කෙසේ සිදු විය යුතුදැයි දැන සිටියේ තමන්වහන්සේගේම රාජකීය ශුද්ධවූ භාවයෙන් දෙවියන්වහන්සේම පමණි. කුරුසිය මත මිය යාමට උන්වහන්සේගේ පුත්‍රයාණන් නමැති දීමනාවේ අවශ්‍ය වීම මෙම මාර්ගය විය.

එසේ දෙවියන්වහන්සේ වේදනා වින්දේ නම්, පියාණන් හට කීකරුව මරණය දක්වා ක්‍රිස්තුස්වහන්සේ වේදනා වින්දේ නම්, මිනිසාගේ විඳවීම නමැති පූර්ණ ගැටළුවම අලුත් තලයකට ඔසවනු

ලබයි. දෙවියන්වහන්සේ තුළ විශ්වාසය නොමැතිව, විඳවීම යනු දරාගත යුතු දුෂ්ඨ භාවයකි. විශ්වාසය සහ දේව පුත්‍රයාගේ උදාහරණය සමඟ විඳවීම, පිරිසිදු සහ උතුම් භාවයට පත්කරන අතර, එය විඳවීම ලබන්නා තමන්වහන්සේ වෙතට ගෙන ඒමට දෙවියන්වහන්සේගේ මාර්ගය වේ. එය දෙවියන්වහන්සේගේ දඬුවමවන සැබැවින්ම දිව්‍යමය ශික්ෂණය වේ.

## "සියල්ල අලුත් කරමි"

දෙවියන්වහන්සේගේ පුත්‍රයා වේදනා වින්දේ නම්, මිනිසා එයින් බේරීම බලාපොරොත්තු විය හැකිද? නමුත් විඳවීම ඔබ්බෙහි වූයේ නැවත නැගිටීමයි. නැවත නැගිටීම ඔබ්බෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය පැමිණෙයි. එහි ක්‍රිස්තුස්වහන්සේ රාජ්‍ය කිරීමට පැමිණෙන අතර දැනටමත් උන්වහන්සේගේ අනුගාමිකයන් වීමට කැපවූ අය උන්වහන්සේ වෙතට ගනු ඇත.

රාජ්‍යය පිහිටුවීමට කාලය ඉතා ආසන්නය. නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමට ප්‍රථම ලෝකයට, එමෙන්ම උන්වහන්සේගේ ගෝලයන් හට, මහත් ව්‍යසන පැමිණෙන බැව් ස්වාමීන්වහන්සේගේම වදන් වලින් සහ අනෙකුත් බොහෝ අනාගතවාක්‍ය තුළින් පැහැදිලි කරයි.

> "මක්නිසාද ලෝකයේ පටන්ගැන්මේ සිට මේ දක්වා නුණාවූ, මතු කොයි කලෙකත් නොවන්නාවූ මහත් පීඩාවක් ඒ කාලයෙහි වන්නේය. ඒ දවස් ලුහුඬු නොකරන ලද්දේවී නම් කිසි කෙනෙක් නොගැළවෙන්නේය. නමුත් තෝරාගනු ලැබූවන් උදෙසා ඒ දවස් ලුහුඬු කරනු ලබන්නේය." (මතෙව් 24:21,22)

නමුත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දර්ශණය වන විට, උන්වහන්සේ පෘථිවිය සියලු දුෂ්ඨකම්න් පිරිසිදු කොට පාපය සහ ආත්මාර්ථකාමීත්වය පහතට ඇද දමා, වසංගත නැතිකොට - අවසානයේදී මරණය නැති කරනු ඇත. උන්වහන්සේ දෙවියන්වහන්සේ වෙනුවෙන් රාජ්‍ය කොට විඳවීම සදාකාලයටම ඉවත් කරනු ඇත. එවිට, පැට්මෝස් දිවයිනේදී අපෝස්තුලුවර යොහන් ශ්‍රවණය කල වදන් ඉටු වෙනවා ඇත.

"මෙන්න දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමඟය. උන්වහන්සේ ඔවුන් සමඟ වාසය කරන සේක. ඔවුහු උන්වහන්සේගේ සෙනඟ වන්නෝය. දෙවියන්වහන්සේම ඔවුන් සමඟ සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක. උන්වහන්සේ ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුලු පිසදමන සේක. මරණය තවත් නොවන්නේය. වැලපීමත් හැඬීමෙත් වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද පළමු දේවල් පහව ගියේයයි සිංහාසනයෙන් කියන මහත් හඬක් මට ඇසුණේය. සිංහාසනය පිට වැඩහුන් තැනන්වහන්සේ කථාකොට: බලව සියල්ල අලුත් කරමියි කීසේක." (එළිදරව් 21:3-5)

දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ කැඳවීමට පිළිතුරු දෙන්නන් සඳහා, විඳවීමේ මාර්ගය ජීවනයේ මාර්ගය වනු ඇත. විඳවීම ලෝකය තුළ පැවතීමේ පයඅන්ත අභිප්‍රාය එයයි. එම කැඳවීම තවමත් නිකුත් වෙමින් පවතී. එත්මන් දූෂිත ලෝකයට ඔබ්බෙන් වූ බලාපොරොත්තුවක් අපේක්‍ෂා කරන්නන් හට එය ගිවිසුමේ "සුභ ආරංචිය" තුළ සෙවීම සඳහා තවමත් අවස්ථාව ඇත.

---

එල්. පී. සාජන්ට් විසින් රචිත 'නව ගිවිසුම සහ විඳවීම' නමැති පත්‍රිකාවෙන් සකසා ගන්නා ලදී.

# ප්‍රශ්න

1. විඳවීමේ හේතුව කුමක්දැයි බයිබලය පවසන්නේද?

2. දෙවියන්වහන්සේ තුළ විශ්වාසය තබන මිනිසකු හෝ ගැහැණියකගේ ජීවිතය තුළ විඳවීම කුමන අරුතක් ගෙන දෙයිද?

3. දෙවියන්වහන්සේ තම ජනතාව අමතන ක්‍රම දෙකක් විස්තර කරන්න.

4. යෝබ් හට ඔහුගේ විඳවීම් සඳහා දෙවියන්වහන්සේගේ අවසාන ප්‍රතිචාරය කුමක්ද ? දෙවියන්වහන්සේගේ සියලු මාර්ග වටහා ගැනීමටත්, තේරුම්කර දීමටත් හැකිද ?

5. යේසුස්වහන්සේ වේදනා වින්දේ ඇයි ?

6. දෙවියන්වහන්සේ වේදනා විඳිනසේක්ද ? එසේ නම් ඇයි ?

7. යේසුස්වහන්සේ තම වේදනා හැසිරවූයේ කෙසේද? අපගේම විඳවීම් සඳහා අපගේ ප්‍රතිචාර කුමක් විය යුතුද? අන් අයගේ විඳවීම් සඳහා අපගේ ප්‍රතිචාර කුමක් විය යුතුද?

8. ඔබ වේදනා විඳින විට, ඔබ දෙවියන්වහන්සේ සමීපව හෝ දුරස්ථව සිටින බැව් හැඟෙන්නේද? විඳවීම ගැන එය අපට කුමක් උගන්වයිද?

9. යෙසායා 53 පරිච්ඡේදය කියවන්න. මෙම පරිච්ඡේදයේ දිවැසිවරයා විස්තර කරණුයේ කවුද? මනුෂ්‍යයාගේ විඳවීම් ඔබගේම වචනයෙන් ලියන්න.

10. තමා පරීක්ෂා කරන්නැයි දාවිත් දෙවියන්වහන්සේගෙන් ඉල්ලුවේය. (ගීතාවලිය 26:1, 2 පද) දාවිත් මෙසේ ඉල්ලුවේ මන්දැයි ඔබ සිතන්නේද? ඔබ සිතන පරිදි දෙවියන්වහන්සේ කෙසේ ප්‍රතිචාර දැක්වූ සේක්ද?

11. අපගේ විඳවීම් කවදාහෝ අවසානයක් දකිද ? කවදාද ?